# ලංසු කැඳවීමේ ආරාධනය

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## කොන්ත්‍රාත් හැඳින්වීමේ අංකය SLA/1/2017

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන්, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත බූට් සපත්තු (හයිලෙග්) කළු යුවල් 75,000ක් මිලදී ගැනීම සඳහා පිළිගත් හා සුදුසුකම් ලත් ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරී මිල කැඳවීමේ පිළිවෙත යටතේ සිදු කරනු ලැබේ.

3. ලෙදර් හයිලෙග් සපත්තු නිෂ්පාදන කර්මාන්තයේ අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් සහිත දේශීය නිෂ්පාදකයන් වෙතින් ලංසු කැඳවනු ලැබේ. අදාල භාණ්ඩ නිෂ්පාදනයේ නොයෙදෙන ලංසු කරුවන් විසින් නිෂ්පාදකයාගේ අවසරය සහිතව ලංසු ලේඛණයේ පරිච්ඡේද IV ආකෘති පත්‍රයට අනුව ලංසු ඉදිරිපත් කල යුතුය. (එවැනි දේශිය නිෂ්පාදකයන් අවම වශයෙන් වසර 5ක වත් ලෙදර් සපත්තු නිෂ්පාදන ක්ෂෙත්‍රයේ පළපුරුද්ද සහිතව විය යුතු අතර, එවැනි ලංසු කරුවන්ටත් අවම වශයෙන් වසර 03ක කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් තිබිය යුතුය.).

4. මිල ගණන් ඉදිරිපත් කිරිමට අපේක්ෂිත සුදුසුකම් ලත් සැපයුම් කරුවන් හට ශ්‍රී ලංකාවේ කොළඹ 03, බාලදක්ෂ මාවතේ පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේ යුධෝපකරණ මාසටර් ජෙනරාල් වෙතින් වැඩි විස්තර ලබා ගත හැක. (දු.ක අංකය/ ෆැක්ස් අංකය 011-2432135, mgobr@army.lk) තවද, සතියේ වැඩ කරන දින වල පෙ.ව 09.00 සිට ප.ව 03.00 පැය දක්වා ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේදී ලංසු ලේඛන නොමිලේ පරික්ෂා කල හැක. ආරක්ෂක අමාත්‍යාංශයේ, ප්‍රධාන ගණකාධිකාරී වෙත ලිඛිත ඉල්ලීමක් සමඟ ආපසු නොගෙවන ලද රු. 35,000.00ක් ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත මුදලින් ගෙවීමෙන්, ඉංග්‍රීසි මාධ්‍යයෙන් මුද්‍රිත ලංසු කැඳවීමේ ලේඛණ ලබා ගත හැක. ලංසු ලේඛණ 2017.01.09 වන දින සිට 2017.01.30 වන දින දක්වා නිකුත් කරනු ලැබේ.

5. අපේක්ෂිත ලංසුකරුවන් තම ලංසු ලේඛන මිලදී ගැනීමට පෙර, 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ (අදාල වන්නේනම්) ලියාපදිංචි වී එම ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කල යුතුය.

6. ලංසු කරුවන් අසාදු ලේඛණගත නොවිය යුතුය.

7. ඉහත දක්වා ඇති ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවට අමතරව රු. 65,000.00ක ආපසු නොගෙවන මුදලක් (මුදලින්) නියැදි පරික්ෂාව සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ගෙවිය යුතුය.

8. ලංසු 2017.01.31 වන දින පෙරවරු 10.00 පැයට පෙර සභාපති, අමාත්‍ය මණ්ඩල විසින් පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව, ආරක්ෂක අමාත්‍යාංශය , අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03. යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ පහත ලිපිනයට ලැබෙනසේ ගෙනවිත් භාර දීම කල හැකිය.

ප්‍රධාන ගණකාධිකාරී,
බිම් මහල, ආරක්ෂක අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03.

ලංසු භාර ගැනීම අවසන්වූ වහාම ලංසු විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ලංසු කරුවන්ට හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට ලංසු විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටිය හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර ගනු නොලැබේ.

9. ශ්‍රී ලංකා මුදලින් රු. 2,600,000.00 වටිනාකමකින් යුත් ලංසු බැදුම්කරයක් (ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් ලබාගත්) ඉදිරිපත් කරන සෑම ලංසුවක් සමගම ලබා දිය යුතුය. මෙම ලංසු බැදුම්කරය ප්‍රථම ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කල හැකි බැදුම්කරයක් විය යුතුය.

10. වැඩි විස්තර සඳහා අමතන්න.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණකාධිකාරි | - | ආරක්ෂක අමාත්‍යාංශය |
| දූරකථන අංකය | - | 011-2439381/ ෆැක්ස් අංකය 011-2390720 |
| යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව<br>යුද්ධ හමුදා මූලස්ථානය | | |
| දූරකථන අංකය | - | 011-2432135 / ෆැක්ස් අංකය 011-2432135 |

11. ලංසු විවෘත කිරිමේ අවස්ථාවට සහභාගි වීමට අපේක්ෂිත පුද්ගලයන්ගේ නම් සහ ජා.හැ.ප / විදේශ ගමන් බලපත්‍ර අංකය, ලංසු විවෘත කිරිමට නියමිත දිනට තෙදිනකට (03) පෙර ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි වෙත ලිඛිතව ලබා දිමට කටයුතු කරන ලෙස සියළුම ලංසු කරුවන්ට දැනුම් දෙනු ලැබේ.

සභාපති,
අමාත්‍ය මණ්ඩල විසින් පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ආරක්ෂක අමාත්‍යාංශය
අංක 15/5, බාල දක්ෂ මාවත,
කොළඹ 03.